# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2095/46 - 2018 නොවැම්බර් මස 02 වැනි සිකුරාදා - 2018.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම් කොටස්, බණ්ඩාරගම නගර සංවර්ධන වැඩසටහන සඳහා වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් කොටස් අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2018 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බණ්ඩාරගම ගමේ පිහිටි කළුතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ඉඩමට අදාළව පිළියෙල කර ඇති අංක Ka/BND/17/350 සහ 2017.09.21 දිනැති ප්‍රගමන අනුරේඛනයෙහි කැබලි අංක ඒ, බී හා සී වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 4.2976 ක් පමණ විශාල වූ පොකුණකුඹුර, සායාකුඹුර, වැවේකුඹුර, නයිදෙනියකුඹුර සහ කොටුන්නේකුඹුර නැමැති ඉඩම් කොටස්හි මායිම් පහත පරිදි වේ.


1A - G 28844 — 10 (2018/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**කැබලි අංක ඒ - ප්‍රමාණය හෙක්ටයාර් 3.1147**

*උතුරට* : රත්නපුර පාර ;

*නැගෙනහිරට* : එච්. එම්. පී. ආර්. බණ්ඩාර සහ එන්. එම්. ජේ. එස්. බණ්ඩාර හිමිකම් කියන මල්හලනාවත්ත, ඇළ, කුමුදුනී චන්ද්‍රිකා කොටිගල හිමිකම් කියන වරිපනම් අංක 47/7ඒ, ජනාධිපති මාවත, පලිහේනගේ ජින්සන් ජයතිලක හිමිකම් කියන ඉහලවත්ත හෙවත් කිතුල්ගහවත්ත, ගොලුවගෙවත්ත හෙවත් කිරිල්ලවලවත්ත, ගල්පොත්තෙවත්ත හෙවත් පහලවත්ත සහ උඩුවගෙවත්ත, සුනන්දා කාන්ති වික්‍රම හිමිකම් කියන වරිපනම් අංක 47/23 ඒ ජනාධිපති මාවත, එම්. විජේතිලක සහ එම්. එච්. සී. කුලසිංහ හිමිකම් කියන ඉහලවත්ත හෙවත් කිතුල්ගහවත්ත, ගොලුවගෙවත්ත හෙවත් කිරිල්ලවලවත්ත, ගල්පොත්තෙ වත්ත හෙවත් පහලවත්ත සහ උඩුවගෙවත්ත සහ සමන්ති හද්දගොඩ හිමිකම් කියන වරිපනම් අංක 43/2 සහ 43/3 ජනාධිපති මාවත ;

*දකුණට* : ජනාධිපති මාවත ;

*බටහිරට* : ඇළ.

**කැබලි අංක බී - ප්‍රමාණය හෙක්ටයාර් 0.0195**

*උතුරට* : ඇළ හා කැබලි අංක ඒ ;

*නැගෙනහිරට* : මාර්ගය සහ කැබලි අංක ඒ ;

*දකුණට* : ජනාධිපති මාවත සහ කැබලි අංක ඒ ;

*බටහිරට* : ජනාධිපති මාවත, කැබලි අංක ඒ හා ඇළ.

**කැබලි අංක සී - ප්‍රමාණය හෙක්ටයාර් 1.1634**

*උතුරට* : ජනාධිපති මාවත ;

*නැගෙනහිරට* : මාර්ගය, රජය හිමිකම් කියන බණ්ඩාරගම සතිපොල, පද්මලතා පෙරේරා හිමිකම් කියන ආදර්ශවත්ත, මාර්ගය සහ තිස්ස ජයසිංහ හිමිකම් කියන ගජේරුවත්ත ;

*දකුණට* : තිස්ස ජයසිංහ හිමිකම් කියන ගජේරුවත්ත ;

*බටහිරට* : තිස්ස ජයසිංහ, සී. එල්. සේනානායක, එම්. ඩී. එස්. කේ. කුරේ හිමිකම් කියන ගජේරුවත්ත, සීතා රංජනී කලංසූරිය හිමිකම් කියන නයිදෙනිය ඕවිට ඇළ හා මාර්ගය.

11 - 756

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.